
**එකගෙයි කෑම එකල රජරට**
**වැව්ගම්මානවල බහුලව සිදුකෙරිණි.**
**එකම පවුලේ දෙ සොහොයුරන් එක බිරිඳක**
**හා දීග කෑම එකගෙයි කෑම යි.**
**එකෙක් පැලේ දොරකඩට**
**කුල්ල මාදා කළ විට අනෙකා පැලට**
**ගොඩ වදින්නේ නැත.**
**එසේත් නැත්නම්, එකෙකුගේ අමුඩය**
**දොර පියන මත රඳවා තබා ඇත්නම්**
**අනෙකා පැලට ගොඩ නොවදින්නට**
**වගබලා ගනී. අදාළ අය**
**ඒ මොහොත වන විට ස්වකීය**
**ලිංගික චර්යාවන්හි නිරත වන බව**
**ඉන් සංකේතවත් කරයි.**


මහාචාර්ය
**සේන නානායක්කාර**





B.A., M.A.(Research), Ph.D., වේදිකාවේ,
ගුවන්විදුලියේ හා රූපවාහිනියේ රංගන ශිල්පියෙකි.
රාජ්‍ය සම්මාන උළෙල රාශියක සභාපතිවරයෙක් මෙන්ම
ජූරි මණ්ඩල සාමාජිකයෙකි. ගුවන්විදුලි
රාජ්‍ය උපදේශක සභාවේ සභාපතිවරයා ය.
මේ වන විට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ
ජනසන්නිවේදනය පිළිබඳ මහාචාර්යවරයා ය.





# පුරාතන රජරට ගැමි සන්නිවේදන රටා

(නූතන පුවත් සන්නිවේදනය සහ සැසඳීමක්)

මේ කෙටි නිබන්දයෙහි ප්‍රමුඛ අධ්‍යාශය වනුයේ නූතන රූපවාහිනී මාධ්‍යයේ ප්‍රවෘත්ති සම්ප්‍රේෂණය හා පූරාතන ගැමි සමාජය තුළ් තොරතුරු සන්නිවේදනය පිළිබඳ සුවිශේෂතා හඳුන්වාදීම යි. ප්‍රවෘත්ති හා නූතන රූපවාහිනී මාධ්‍ය පිළිබඳ අප කොතෙකුත් කරුණු හඳුනාගත්ත ද, පූරාණ ගැමි සමාජය තුළ පැවති සන්නිවේදන විධි පිළිබඳ ගැඹුරු අවධානයක් අප අතර නොමැති බව පෙනේ. එය වාචික අවාචික හෝ සංඥා, සංකේත හෝ වෙන යම් විධික්‍රමයක් ඔස්සේ සැකසුනක් විය හැකි ය. ඒවායෙහි අරමුණු, ව්‍යුහය, ක්‍රියාකාරීත්වය, පලදායකත්වය හා සමාජ බලපෑම ද ග්‍රාමීය ජීවන රටාව ඔස්සේ ම විමසීම මේ තුළින් සිදුකෙරේ. ගැමි ජන ජීවන රටාවෙහි යථාර්ථය සූචනය කරනු උදෙසා ම මෙකී අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබුවේ රජරට නුවරකලාවියට අයත් වැව් ගම්මාන ක්ෂේත්‍රය යි.

රූපවාහිනිය යනු අද්‍යතන ගෝලීය සමාජයේ හෘඩය තීරණය කරන අච්චුවක් ලෙස ප්‍රකට ය. එය එතරම් ම බලපෑම්සහගත මාධ්‍ය මෙවලමක් බවට පත්ව ඇති බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. මීට සියවස් කිහිපයකට පෙර පැවති හුදෙකලා සමාජයෙන් අනතුරුව වූ ක්‍රමික විකාශනය තුළ සිදුකෙරුණු දැනුම හා තොරතුරු සම්පාදන ක්‍රියාවලිය විසින් එකී විප්ලවීය පරිවර්තනයට පසුබිම සැකසිණි. එබැවින්, අද අප හාත්පස පවත්නේ තොරතුරු, සමාජයක් බව (Information Society) විද්වත්හු පවසති.

දවසේ පැය විසිහතර පුරා මානවයා විසින් අත්විඳිනු ලබන සකලවිධ සංවේදනයන් පුළුල් ලෙස සලකා බලන කල ඒ සියල්ල සන්නිවේදනය හා ඓන්ද්‍රියව බද්ධවෙයි. මාධ්‍ය වූ කලී එහි එක් ආනුෂංගික පලයකි. තොරතුරු, ආරංචි, පණිවිඩ, පවත්, පුවත් හෝ ප්‍රවෘත්ති ආදී වශයෙන් නාමකරණය ලබන සියල්ලක්ම මෙකී

මාධ්‍යයෙහි ලා ආගන්තුක නොවනුයේ එබැවිනි. රූපවාහිනී මාධ්‍ය හා ප්‍රවෘත්ති ද අපට වඩාත් සමීප වන්නේ ඒ අනුව යි.

රූපවාහිනී මාධ්‍යයේ සමාජීය පලදායකත්වය හෝ තාක්ෂණික විපුලතාව පිළිබඳව අපි නිරන්තරයෙන් සංවාද කොට ඇත්තෙමු. Tele + Visio නම් වූ ග්‍රීක් + ලතින් වහරින් පැනෙන දුරදැක්ම යන පදරුත් මෙයින් නිෂ්පන්න ය. එසේත් නොවේ නම්, distant + sight හෙවත් දූර දර්ශනය යන්න එයින් සූචිත ය. ඉන්දියාව සිය රූපවාහිනිය දූරදර්ශන් ලෙස හඳුන්වනුයේ එබැවින් විය යුතු ය. මේ සියලු අරුත් Television යන්නෙහි අන්තර්ගත බවට විසංවාදයක් නැත.

ඉංග්‍රීසි ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය හඳුන්වන පරිදි Television යන්න අර්ථ දක්වෙන්නේ "චලනරූප හා ශබ්දය සහිත වැඩසටහන් විකාශනය කළ හැකි වීදුරු තිරයක් සහිත විද්‍යුත් මෙවලමක්" ලෙසිනි. (A piece of electrical equipment with a glass screen which shows broadcast programmes with moving pictures and sounds)ගුවන්විදුලි සංඥා මඟින් සම්ප්‍රේෂණය කරනු ලබන ශබ්ද සහිත දෘශ්‍ය ප්‍රතිරූප තිරයක් මත ප්‍රතිනිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය එයින් පැහැදිලි කෙරේ.

ශබ්දය සහිත චලනරූප ගුවන්විදුලි සංඥා මඟින් සම්ප්‍රේෂණය කරවීමේ ශක්‍යතාව යන කාරණයට සමාන්තරව එහි විද්‍යමාන සුවිශේෂතා රැසක් පිළිබඳ පැහැදිලි කෙරේ. එනම්, පළමුවැන්න, එය ශ්‍රව්‍යදෘශ්‍ය (Audio visual) වෙයි. දෙවැන්න, එහි ක්ෂණිකත්වය හා සජීවතාව (Immediacy and Liveliness) ප්‍රබලවෙයි. රූපවාහිනි මාධ්‍යයේ ප්‍රමුඛතම තාක්ෂණික වටිනාකම් ලෙස ගැනෙන මෙකී සුවිශේෂතාවන් හේතුකොටගෙන ම ඊට ආනුෂාංගික වූ ප්‍රවෘත්ති හෙවත් News කෙරෙහි සුවිශාල වැදගත්කමක් ආරෝපණය වනු පෙනේ.

16 වන සියවසේ මුල් භාගයේ සිට 18 වන සියවසේ අවසානය දක්වාම ප්‍රවෘත්ති යන්න අරුත් ගැන්වූයේ සිව් දිසාවෙන් ළඟාවෙන තොරතුරු ලෙසිනි. News යන ඉංග්‍රීසි වචනය ගොඩනැගෙනුයේ ද North, East, West and South යන සතර දිසාවන් අඟවන වචනවල මුලකුරු එක්වීමෙන් බව තත්කාලීන ප්‍රකට මතයකි. නමුත්, පසුකාලීනව එය Novelties හෝ Newness යන පදගතාර්ථ සහිත හඳුනාගැනීමක් බව පිළිගැනිණි (මහේන්ද්‍ර 1997:204). කිසියම් අපූර්ව බවක් හෝ අලුත් බවක් හෝ එහි ප්‍රතීත ය.

මේ වන විට අප රට තුළ භාවිත කෙරෙන රූපවාහිනී යන්ත්‍ර සංඛ්‍යාව මිලියන තුනකට ආසන්න ය. දේශීය රූපවාහිනී නාලිකා ගණන පහළවක් පමණ වෙයි. ප්‍රධාන

ප්‍රවෘත්ති ප්‍රකාශයන් ඇතුළු පුවත් ප්‍රකාශ දිනකට වාර ගණනින් සියයකට වඩා වැඩි ය. ඒ හැර කාලීන සිදුවීම් පිළිබඳ සැකසුණු වැඩසටහන් ද විරල නොවේ. ඒ සියල්ල තුළින් ප්‍රේක්ෂක ප්‍රජාව වෙත මුදා හැරෙන්නේ තොරතුරු අතිවිශාල සංඛ්‍යාවකි.

ඊට සමගාමීව රටතුළ භාවිත කෙරෙන ගුවන්විදුලි යන්ත්‍ර සංඛ්‍යාවත් දිනපතා, සතිපතා පුවත්පත් හා වාරසඟරා ආදියත්, අන්තර්ජාලය ඇතුළු සෙසු ප්‍රවෘත්තිමය මාධ්‍යයනුත් සුවිශාල ය. ඒවායින් ප්‍රේෂණය කෙරෙන පුවත් තොරතුරු හෝ ප්‍රවෘත්ති සංඛ්‍යාවෙන් මැනිය නොහැකි තරම් ය. අද අප ජීවත් වන්නේ තොරතුරු සමාජයකැයි කීම අතිශයෝක්තියක් නොවන්නේ එබැවිනි.

ඒ අනුව ගෝලීයකරණ ක්‍රියාදාමයක් තුළ අපි අද ජීවත්වෙන්නෙමු. ලෝකයේ කවර තැනෙක සිදු වූ හෝ සිදුවෙමින් පවත්නා හෝ කිසියම් දෙයක් පිළිබඳ තත්පර කිහිපයක් තුළ දී අප දැනුම්වත් විය හැකි ජනමාධ්‍ය ජාලයක් අපට හිමි ය. ලෝකය විශ්ව ගම්මානයෙන් ඔබ්බට දිවෙන විශ්ව පවුලක් බවට පත්ව ඇති බව පෙනේ (Global Family). ඒ අනුව රූපවාහිනිය එහි ප්‍රබල පුවත් වාහකයෙක් යැයි කීම අතිශයෝක්තියක් නොවේ.

නමුත්, එදා ඈත රජරට වැව් ගම්මාන වල සිදුකෙරුණු පුවත් සන්නිවේදනය කවරාකාරයෙන් සිදුවීද? සුවිශාල යන්ත්‍ර සූත්‍රවලින් තොර, කිසිදු ආයතනික සම්බන්ධතාවක් නැති, අතිවිශාල ජන සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් බැහැර වූත්, දැවැන්ත මූල්‍ය ආයෝජනයන්ගෙන් වියුක්ත වූත් තොරතුරු සම්පාදනයක් එහි වූ බව පෙනේ. එය වාචික හෝ අවාචික විය හැකි ය.

බොහෝවිට ඒවා පුද්ගලාන්තර වෙයි. ඉන් ඔබ්බට සමූහ සන්නිවේදනයක් ද විය හැකි ය. එය කන්න රැස්වීමක් හෝ වරිග සභාවක් විය හැකි ය. එසේ නොවේ නම් යම් කිසි කොටුගමක මහගමරාල විසින් සිය අතවැසියකු අත එවනු ලබන පණිවිඩයක් විය හැකි යි. එසේත් නොවේනම්, බද්දෙරාල, උණ්ඩිය රාල හෝ වෙදරාල විසින් බැඳ එවනු ලබන අණ බෝලයක් විය හැකි යි.

එදා නුවරකලාවියේ වැව්ගමකට සමීප වෙමින් අපි මේ පිළිබඳ විමසා බලමු.

වඩාත් නූතන නිර්වචනයන්ට අනුව පරිපාලනමය වශයෙන් සලකාබලන කල "ශ්‍රී ලංකාවේ ජනාවාස අතර කුඩාම ජනගහන ඒකකය හැඳින්වෙනුයේ ගම නමිනි" (හේරත්

1998:199). එමෙන්ම, 'පුද්ගලයින් සතු ඉඩකඩම්, වතු පිටි හෝ වෙනත් දේපල ආදිය එක් ස්ථානයක රාශි ගත වී ඇති පංගු රාශියක් හැඳින්වීම' සඳහා ද (හේරත් 1998:199) මෙම වචනය භාවිත කෙරෙන බව පෙනේ. මිනිස් ජනාවාසයකට අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු අවම පහසුකම් හෝ අඩුවැඩි වශයෙන් සහිත වූ මෙම ගැමි ප්‍රදේශයන්, අනතුරුව, පත්තුව, කෝරළය හා දිශාව ආදී වශයෙන් විශාල ඒකකයක් දක්වා පුළුල් වෙයි. ඒ අනුව ගත් කල, කුඩාම මිනිස් ජනාවාසය ගමයි (Davids:1871). පාළි භාෂාවේ එන 'ගාම' හා සංස්කෘත භාෂාවේ එන 'ග්‍රාම' යන්නෙන් නිෂ්පන්න 'ගම' යන වචනය, ගම්මානය, ගංකුඩුව, ගංකොටුව හා ගංගොඩ ආදී වශයෙන් ද වැහැරේ.

මෙකී අධ්‍යයනයෙහි ලා ක්ෂේත්‍රය කොට ගැනෙනුයේ රජරට පුරාණ වැව් ගම්මානයන් වෙයි. මීට සියවස් දෙකක් ඈතට ආපසු හැරී බලන්නට හැකි නම් එකී ගම් බිම් ගැන අවබෝධයක් ලබා ගැනීමට හැකිවනු ඇතැයි ඒ පිළිබඳ ඓතිහාසික තොරතුරු හැදෑරීමෙන් පෙනී යයි.

වැව් ගම්මානයක් යනු වැවක් කේන්ද්‍ර කොට ගත් ගමකි. වැවක් නැති ගමක් නැත. වැව වූ කලී ගමේ කේන්ද්‍රීය අනන්‍යතා ලක්ෂණය වන තරමටම එය ප්‍රමුඛත්වයේ ලා සැලකේ. රජරට පුරා විසිරී ඇති මෙබඳු ගම්මාන ගණනින් දහස් සංඛ්‍යාත ය. ඒ හැම ගමකම වැවක් ඇත. සමහර ගමක වැව් දෙකක් හෝ තුනක් ද ඉඳහිට දක්නට ලැබෙන අවස්ථා නැතුවා නොවේ. මේ අයුරින් ගත් කල ගම හා වැව එකිනෙක වෙන් කළ නොහැකි සමාජ සම්බන්ධතා ක්ෂේත්‍රයක් ලෙස හැඳින්වෙයි.

මහාචාර්ය රැල්ෆ් පීරිස්ගේ ස්වකීය 'සිංහල සමාජ සංවිධානය' කෘතියෙහි ලා 'නුවරකලාවිය කේන්ද්‍රගත ගම' ගැන ලියනු ලබන පරිච්ඡේදයෙහි ආරම්භය සළකුණු කරනුයේ මෙසේ ය. ''උස් තැනක සිට වැව් රට නිරීක්ෂණය කරන විට...'' ආදී වශයෙනි. මෙහිදී 'වැව්රට' ලෙස පීරිස්ගේ හඳුන්වාදෙනුයේ රජරට නුවරකලාවිය භූ කලාපය යි. එය එපරිද්දෙන් ම වැව්වලින් ගහන ය. එය විවිධ අවස්ථාවලදී 'වැව්බැඳි රාජ්ජේ' (දිසානායක 1996(141) ලෙසත්, 'වැව්දාගේ රට' ලෙසත් (කහඳගමගේ 1990:vii) හඳුන්වනුයේ එබැවිනි.

සෑම ගමකම පාහේ වැවක් හා එයට පහළින් වූ වෙල්යාය ත් පළමුවෙන්ම ඇත. ඊ ළඟට දක්නට ලැබෙන්නේ ගස් සෙවණේ පිහිටා ඇති පංගුකාරයින්ගේ පැල්පත්ය. මෙම පැල්පත් වැව් බැම්මට පහළින් හෝ කුඹුරු දෙපැත්තේ හෝ ඉදිකොට ඇත. මීළඟට දක්නට ලැබෙන්නේ ගම් සීමාව තුළ පිහිටි මුඩුබිම් ය (Devids 1871:71).

ඇත්තවශයෙන් ම මුළු නුවරකලාවිය පළාතම සැදී තිබුණේ මෙවැනි කෘෂිකාර්මික සමූහාණ්ඩු ගණනාවකිනි. සෑම කේන්ද්‍රගත ගමක් ම වැවකින් හා ඊට පහළින් පිහිටි වෙල්යායකින් ද සමන්විත විය (පීරිස් 1963:244).

ගම හා වැව අතර ගොඩනැගෙන මෙම දෘඪතර බැඳීම කෙරෙහි ලා මූලික වශයෙන් හේතුවනුයේ එහි ආර්ථික ක්‍රමය හා ජීවනෝපාය රටාව ය. වසර විස්සකට ආසන්න කාලයක් ලංකාවේ සිරකරුවෙකුව සිටි රොබට් නොක්ස් විසින් 1696 දී ලියා පළ කරන ලද 'An Historical Relation of the Island of Ceylon' නම් කෘතියෙහි සිංහල අනුවාදය සඳහන් කරන පරිදි ''මේ රටේ ප්‍රධාන ජීවන වෘත්තීය ගොවිතැන ය'' (කරුණාරත්න 2001(277). ඒ අනුව ගත් කල වැව වූ කලී ගමේ ප්‍රමුඛතම සමාජ සම්බන්ධතා කේන්ද්‍රය ලෙස පිළිගෙන තිබිණි. ඒ සඳහා පසුබිම් සැකසෙන්නට අදාළ සියලු වාතාවරණය නිතැතින්ම නිර්මාණය වී තිබූ බව පෙනේ.

එපමණක් නොව, ගමට නම ලැබීමේ සිට සියලු සමාජ අවශ්‍යතා කෙරෙහි වැව මූලික වන අයුරු පෙන්වාදීම මෙහිදී අත්‍යවශ්‍ය වෙයි. උපත්විපත්, මඟුල්තුලා, කෙළිසෙල්ලම්, පුදපූජා හා සිරිත් විරිත් ඇතුළත් මුළු ගැමිජන ජීවිතයම සපුරා වැව හා බැඳුනක් වීම මෙහි විශේෂත්වය කි. එබැවින්ම, ''වැව්බැඳි රටේ ඇත්තන්ගේ හඳුන්පොත වන්නේ වැව ය'' (මානෑව 2001(206). මෙහි හඳුන්පොත යනු හදවත යි. හෘදයවස්තුව යි. එය අක්‍රීය වූ කල සියල්ල කම්මුතු වන බව ගැමියෝ දනිති. සෙසු සියලු අංග ප්‍රත්‍යංගයෝ ඊට දෙවැනි බව එයින් කියැවේ. එහෙයින්ම, වැව වූ කලී වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ගැමියාගේ ආත්මය බවට පත් විය.

ඒ අනුව, 'වැව' කොතරම් වැදගත් වී ද යත්, වැව හා ගම යන වචන දෙක සමානාර්ථයෙන් ම යෙදුණේ ය. සමහර ස්ථානවල ගම යන වචනය ව්‍යවහාර කරන ලද්දේ කලාතුරකිනි. මිනිසුන් අයත් වූයේ 'සියඹලාගහගමට' නොව 'සියඹලාගහවැවට' ය (පීරිස් 1963 (249-250). දිවුල්වැව, නබඩවැව. හල්මිල්ලවැව, කෝංගස්වැව, පළුගස්වැව, මීගස්වැව, ආදී නම් ගමට පට බැඳුණේ එලෙසිනි. අද වන විට ඒවා දිවුල්ලෑව, නබඩෑව, හල්මිල්ලෑව, කෝංගස්සෑව, පළුගස්සෑව හා මීගස්සෑව ආදී වශයෙන් සුබෝච්ඡාරණයෙහි ලා භාෂාත්මක පෙරළියකට ලක්ව ඇත්තේ ද එහි සමීපත්වය තවදුරට ත් තහවුරු කරමිනි.

වැව හා ගම අතර සම්බන්ධය එබඳු ය. එය සපුරා විස්තර කොට අවසන් කිරීම එතරම් පහසු නොවේ. නමුත්, තත් ලේඛනයෙහි ලා අත්‍යවශ්‍ය කේන්ද්‍රීය ප්‍රස්තුතයට

අදාළ ඒ සම්බන්ධ දත්ත හා තොරතුරු සහිත තහවුරු කිරීම් ප්‍රමාණවත් බව පෙනේ. එබැවින්, දැන් අපගේ අවධානය යොමු විය යුත්තේ එහි සන්නිවේදන විධි පිළිබඳව යි. වැව් ගම්මානය උදෙසා ම අනන්‍ය ව පැවැති සංඥා, සංකේත ඇතුළත් සෘජු අවාචික භාවිතයන් සුවිශේෂ විමසුමකට ලක්කිරීම අප අධ්‍යයනයේ අරමුණු අතර ප්‍රධාන ය. ඒ අනුව, වාචිකව ඉදිරිපත් කෙරෙන සාමාන්‍ය භාෂා ව්‍යවහාරයන්ට වඩා අවාචිකත්වය තුළ ප්‍රකට කෙරෙන නිර්මාණාත්මක සම්බන්ධය විමර්ශනයට ලක්කිරීම ත්, ඉන් පිළිබිඹු කෙරෙන සෘජු ප්‍රකාශනමය ශක්‍යතාව හා සමාජ අවශ්‍යතාව ඉටුකිරීම පිළිබඳ තුලනාත්මකව ගවේෂණය කිරීමත් එහි ප්‍රමුඛතම කාර්යභාරයක් බවට පත්විණි.

'සන්නිවේදනය' යනු අදහස්, හැඟීම්, ආකල්ප හා තොරතුරු ආදිය හුවමාරු කිරීමේ පුළුල් ක්‍රියාවලිය කි. ''සියලු මානව සම්බන්ධතා ඇති කිරීමට ත්, පවත්වා ගැනීමට හා අන්තර් ක්‍රියාවලි සඳහා පසුබිම් සැකසීමටත් පාදක වන්නකි'' (Berlo 1960:xi). සන්නිවේදනය සම්බන්ධයෙන් ගත් කල පොදු සමාජ සත්තාව එය වෙයි. එකී ක්‍රියාවලිය වාචික හෝ අවාචික විය හැකි ය (Verbal or Nonverbal). වාචික සන්නිවේදනය යනු වචනය උපයෝගී කොටගෙන කරන්න කි. අවාචික සන්නිවේදනය යනු වචනය භාවිතයෙන් තොරව සිදු කරන්න කි. එය විටෙක සංඥාවක් හෝ සංකේතයක් විය හැකි ය. නොඑසේනම් රූපසටහනක් හෝ ග්‍රාෆික සිතුවමක් විය හැකි ය. එසේත් නොවේ නම් වෙනත් ස්වභාවික පාරිසරික තත්ත්වයක් වියහැකි ය. එනම්, සංඥාර්ථ භාෂාවකි (Sign Language). තවත් විටෙක අඟපසඟ සෙලවීම් හෝ මුහුණේ ඉරියව් ආදිය උපයෝගී කරගන්නක් ද විය හැකි ය. එනම්, ශරීර භාෂාවකි (Body Language).

ඒ කවරක් වුව ද අවාචික සන්නිවේදනය වූ කලී උගත් නූගත් කා හටත් වහා අවබෝධ වන සරල සන්නිවේදන ක්‍රියා විශේෂයකි. පුරාණ වැව් ගම්මානයන්හි භාවිත එබඳු සන්නිවේදන විධික්‍රම පිළිබඳ අපි දැන් විමසා බලමු.

''අණබෝලය'' එබන්ද කි. ''අණබෝලය'' යනු මහගමරාළ විසින් හෝ වෙල්විදානේ විසින් නිකුත් කරනු ලබන නියෝගය කි. වැව හා එහි වතුර ආරක්ෂා කරගැනීම, ගැමියා අතර සමගිය හා සාමූහිකත්වය ආරක්ෂා කරගැනීම, ඔවුන් අතර විනය හා සදාචාර සම්පන්න චර්යාවන් පවත්වා ගැනීම, කලට වේලාවට ගොයිතැන් බත් කිරීමට අදාළ කටයුතු සැලසුම් කිරීම හා ගමේ යහපාලනය පවත්වා ගැනීම යන පොදු සමාජ අවශ්‍යතා මෙහිදී අරමුණු කෙරේ. අදාළ අවස්ථාවලදී විවිධ නියෝග හා නිවේදන නිකුත් කිරීමට ඔවුනට බලය පැවරී තිබුණි.

ඒ අනුව වැව් රැකගැනීමෙහි ලා පැනවුණ නීති කිහිපයක් වෙයි. කිඹුලන් සිටින මංකඩවලින් දිය ගැනීම සහ නෑම, පතුල පෑදෙන තරමට වැවේ වතුර ටික ගොවිතැනට භාවිත කිරීම, හොරෙන් මාළු ඇල්ලීම, වැව්කෝල්බඩ ගස්වලට නැග වෙඩි තබා මාළු ඇල්ලීම, පුපුරණ ද්‍රව්‍ය හෝ කුඩා හිල් සහිත දැල් යොදා මාළු ඇල්ලීම, වැවේ ජීවත්වන ඉබ්බන් වැනි සතුන් මරා මස් කෑම, වැව් බැම්මේ කොටු අතු සහ කැට වළවල් කපා වතුර බීමට එන සතුන් දඩයම් කිරීම, පච්චවඩම් සුම්බර බැඳ වැවට බැසීම, කුඩා දරුවන් වැවට බස්සවා මුත්‍රා කරවීම හෝ මළපහ කරවීම, දියමංකඩ, නාන මංකඩ, පිළිමංකඩ හා බොරදිය මංකඩ අවභාවිතය ආදිය එකී නොකළ යුතු ක්‍රියා ගනයට ගැනෙන සමහර කි.

පුරාණ ගැමි සිරිත් විරිත් හා සංස්කෘතිකමය වශයෙන් එහි පැවැති නෛතික පසුබිම පිළිබඳ පැහැදිලි පිළිබිඹුවක් මෙයින් විද්‍යමාන ය. මේ සඳහන විමසා බලමු. ''වැවේ වතුර කිසිවෙක් නිස්කාරණේ නැති නාස්ති නොකරති. අපේ වැව්බැඳි රාජ්ජේ ගැමි ජනතාවෝ වැවේ වතුරට රීරි ඉස්මටත් වඩා ගරුහා කරති'' (මානෑව 2001:210). ඒ අනුව, උක්ත තහංචි නිවේදන හෝ නියෝග, අදාළ ගැමි සමාජය තුළ වඩාත් ප්‍රබල සංස්කෘතිකමය ප්‍රකාශනයක් බවට පත්ව තිබූ බව පෙනේ.

''ගමරාළ ඇත්තා හෝ විදානේ උන්දැ මෙකී තහනම් තහංචි පැනවූයේ අණ බෝලය බැඳීමෙනි. අණබෝලය යනු අඟාව කි. සාමාන්‍ය තහනමට බෝල්පනා තුන්මිටක් නැත්නම් ඉහකොළ තුන්මිටක් ගත් අතර, දිවි කදුරු තුන්මිටක් දිවිකදුරු රිටක පහතට එල්ලෙන සේ ජලයෙන් ඉහළට බැඳ සිටුවා තැබීම බරපතළ දඬුවමක පෙරනිමිත්ත කි. එය ඉක්මවීමට ගමේ කිසිවෙක් කැමැත්තක් නොදැක්වී ය'' (ඉලංගසිංහ 2009:33).

බෝල්පනා තුන්මිටක් සුදු රෙද්දකින් ඔතා පයිංඩකරුවෙක් අත කිසිවෙකු වෙත එවීම ද අණබෝලය බැඳීම කි. එය විදානේ උන්දැ හෝ මහගමරාළ විසින් එවන ලද කැඳවුම් ආඥාව කි. එකී බෝල්පනා තුන්මිටට හොඳින් ඉදුණු නයිමිරිස් කරලක් ද ඈඳා තිබුණේ නම් තත්ත්වය අතිශය භයංකර ය. ඒ ක්ෂනික කැඳවුම කි. කිසිදු සමාවක් නැත. චූදිතයා අදාළ ගමරාළ හෝ විදානේ උන්දැ හමුවට එකෙනෙහි ම යා යුතු ය.

අණබෝලය වූ කලී වැව් රාජකාරියට හෝ චූදිත කැඳවුම්කරයකට පමණක් සීමා වුවක් නොවේ. වෙනත් අවස්ථාවන් සඳහා ද මෙය විවිධ ස්වරූපයෙන් යොදාගැණිනි. වසංගත අණබෝල, වරිග තහංචි අණබෝල, නයිගල අණබෝල හා මරුකතිර කෙටුම ද ඒ අතර කිහිපය කි.

වරිගකුඩුවේ පැලක වසංගත රෝගයක් වේ නම් නිරෝගී වරිගක්කාරයන් ටික දිනකට එහි යාම වළක්වාලීම සඳහා එම පැලෙහි ඉදිරි කඩුල්ල මත බඳින කොහොඹ කොළ අතුමිටිය ''වසංගත අණබෝලය'' යි. එය බඳිනු ලබන්නේ වරිගකුඩුවේ වෙදරාළ විසිනි. එසේම යම් කිසි පැලක් ඉදිරියේ කදුරු අතු මිටියක් බැඳ තිබේ නම් එහි වරිගක්කාරයින්ට වරිග තහංචි පනවා ඇත. ඒ නිසාම එහි කිසිවෙක් නොයති. මෙය ''වරිගතහංචි අණබෝලය'' වේ. ගම් ප්‍රධානියා වූ ගමරාල විසින්ම එය බඳිනු ලබයි.

ඊට අමතරව, පෙත්මගක් හෝ දෙවැටක් අසල හුණුවලින් අඳින ලද නාගරූප ගලක් තබා ඇත්නම් ඒ ඉසව්වේ නපුරු සර්පයෙකු සිටින නිසා ප්‍රවේසම්වීමට කරනු ලැබූ සංඥාවකි ඒ. එය ''නයි අණ ගල්'' හෝ ''නයිගල'' නම්. ඇතැම්හු ගලක් වෙනුවට අඳුකොළ මිටියක් ඒ යන එන මාර්ගයේ පෙනෙන්නට සලස්වති. එය ''නයි අණබෝලය'' වේ (මානෑව 2001(212).

''මරුකතිර කැපුම'' හෙවත් ''මරුකපොලු කැපුම'' ඊට වඩා වෙනස් වූවකි. කැලෑවකට ඇතුළු වන පෙත්මගේ ගසක කතිරයක් කොටා ඇත්නම් එහි නපුරු සතුන් සැරිසරන බව ඇඟවේ. එහි අලි අඩියක සලකුණක් යොදා ඇත්නම් වල් අලියෙක් ඇති බව ද, පහුරු අඩියක් යොදා ඇත්නම් නපුරු කොටියෙක් ඇති බව ද, මිනිස් අඩියක් යොදා ඇත්නම් නපුරු වලසෙක් සැරිසරන බව ද කියැවේ (මානෑව 2001(212).

සතුන්ගෙන් මිනිසුන්ට බෝවන ලෙඩ රෝග මෙන්ම සතුන්ගෙන් සතුන්ට බෝවන ලෙඩ රෝග ද ගමේ ගොඩේ බහුල ය. යම් විටෙක එය ඉතා බරපතල සමාජ වසංගතයක් දක්වා පැතිර යා හැකි දූර්ලක්ෂණය කි. ගවයින්ට එළුවන්ට කුකුළන්ට බල්ලන්ට හා බළලුන්ට බෝවන වසංගත රෝග විශේෂ වෙයි. ''වසංගත වැටිය'' යනු එබඳු නිවේදනයක් අවාචිකව සංකේතාත්මකව ප්‍රකාශ කරන්න කි.

''ගම් දෙකක් අතර ඇති පටු කැලෑ තීරයේ අඩි තුන හතරක් පළලට කොටලා තියනවා නම් තමතමන්ගේ ගම්වලට අයිති සත්තු අයාලේ නොයවන්ඩ ගම්මු වග බලා ගන්නව. හේතුව, ඒ ගමේ සත්තුන්ට මොකක් නමුත් වසංගත රෝගයක් බෝ වෙලා තියනවයි කියලා ගම්මුන්ට ඉන්තේරුවෙන්ම තේරුං යන හින්දා. වසංගත වැටිය කියන්නෙ ඒකට'' (නානායක්කාර 1999:48).

සාක්ෂරතාවයෙහි ඉහළ සුදුසුකම් නොලැබුව ද, වැවවෙල, පැලපිල, ලන්ද, බූටෑව, වනාත, මහවනය ඇතුළු හාත්පස පරිසරය පිළිබඳ අත්දැකීම් ඇති ගැමියාට

මේවා විසඳාලිය නොහැකි ප්‍රහේලිකාවල් නොවේ. ආරක්ෂාව පිළිබඳ නූතන සන්නිවේදන ක්‍රමවේදයන්ට වඩා ප්‍රාථමික ස්වරූපයක් දැරූව ද, වහා තේරුම්යනසුළු බවත්, ඊටම සමගාමී අසංකීර්ණ සරල ස්වරූපය ත් එහි පවත්නා සුවිශේෂ ප්‍රකාශනමය ශක්‍යතා ගනයෙහි ලා ගිනිය හැකි ය.

එකගෙයි කෑම එකල රජරට වැව්ගම්මානවල බහුලව සිදුකෙරිණි. එකම පවුලේ දෙ සොහොයුරන් එක බිරිඳක හා දීග කෑම එකගෙයි කෑම යි. එකෙක් පැලේ දොරකඩට කුල්ල මාදා කළ විට අනෙකා පැලට ගොඩ වදින්නේ නැත. එසේත් නැත්නම්, එකෙකුගේ අමුඩය දොර පියන මත රඳවා තබා ඇත්නම් අනෙකා පැලට ගොඩ නොවදින්නට වගබලා ගනී. අදාළ අය ඒ මොහොත වන විට ස්වකීය ලිංගික චර්යාවන්හි නිරත වන බව දොරට මාදා කළ කුල්ල හෝ දොරේ එල්ලා තැබෙන අමුඩය නොකියා කියයි.

සාංඝික දානය, බුද්ධපූජාව, බෝධිපූජාව හෝ වෙනත් ආගමික වතාවකදී පන්සලේ හඬකද (සණ්ඨාරය) හැඬවීම සාමාන්‍ය දෙයකි. නමුත්, එය අවේලාවේ එක



දිගටම අඛණ්ඩව හඬ නැගේ නම් ඉන්තේරුවෙන්ම ඒ අනපේක්ෂිත කැඳවීමකි. එය හදිසි ආපදාවක හෝ අතුරු අන්තරාවක සංඥාවක් විය හැකි ය.

''ගමේ ඉලව්වක් උන හැටියේම පන්සලේ හඬ කඳ හැඬවෙයි. එවිට දැනමුත්තෝ ඉලව් පැලට සේන්දු වෙති. ගමේ කපුරාල, වෙදරාල, වෙල්විදානේ, ගමරාල, නැකැත්රාල ආදීන් ය ඒ. වෙදරාල එළඟිතෙල් ටිකිත්තක් හුණුඇඟිලි බිත්තරේට අරගෙන පරාණේ ගියා කියන ඇත්තන්ගේ ඉක්කා වළේ මත ගා ඇහැ ඩොක්කාගෙන බලාගෙන ඉන්නෙ එළඟිතෙල් දියාරු වෙනව ද නැත්නම් තිබ්බටත් වැඩිය මිදෙනව ද යන හෝඩුවාව වටහා ගන්ඩයි. පරාණ මුලැසියක් වෙලා නැත්නම් ඉක්කා වළේ එළෙඟි තෙල් ටිකිත්ත දියාරු වෙලා යයි. කයිපයියාවෙන් (සිරුරෙන්) පරාණේ පලව්වි නම් එළඟිතෙල් ඉක්කා වළේ තදේට මිදෙයි. වෙදරාල තමා කරේ දමා සිටි පත්කඩේ පොරවගෙන ලෙඩා සිටි ගෙයින් එළිබැස්සොත් ඒ ගේ ඉලව්ගෙයක් ය. පත්කඩේ උරමාලයක් සේ බැඳගෙන එළිබැස්සොත් දත යුත්තේ ලෙඩාගේ පණ ගිහින් නැති බව ය'' (මානැව 2001(143-144).

ඉදිකඩුල්ලට ලී දැමීම ද රසවත් වූ සංකේතාත්මක සන්නිවේදන විධික්‍රමය කි. පරිසරයට අනුවර්තනය වන ගැමියා සිය හාත්පස සම්පත් අමුද්‍රව්‍ය වශයෙන් භාවිතකොට සරල සන්නිවේදන රටාවන් ගොඩනගා ගත් බවට මෙය කදිම නිදසුන කි. කඩුල්ලට එක ලීයක් දමා ඇත්නම් ගෙහිමියා ළඟපාත සිටියි. ලී දෙකක් වූයේ නම් වැව්පිටියට, හේනට හෝ කුඹුරට ගොස් ඇති බවක් ද, ලී තුනක් ම (සියල්ලම) දමා ඇත්නම් ඔහු ඈතකට ගොස් දින දෙක තුනකට ගෙදර නැති බව ත් කියාපායි.

''යං විදියකින් එතනම කටු අත්තක් හිටවල තිබුණොත් කිසිකෙනෙක් ඒ ගෙදරට ඇතුල්වෙන්නෙ නෑ. මොකද හේතුව, ගැමිය දන්නව ඒ ගෙදර කවුරුහරි යන්තරයක් බැඳල. එහෙම නැත්තං මොකක්හරි ශාන්තියක්, යාතුකර්මයක් කරගෙන කියල. එහෙමවුණාම පිටිං එන ඇත්තො මස් මාංසෙ කාල, රා අරක්කු බීල ආවොත් අර කොරපු වැඩේ බල බිඳෙනව කියල ත් එවුන්දල දැනගෙන හිටිය'' (නානායක්කාර 1999:48).

උපතේදී මෙන් ම මඟුලේදී ත්, මරණයේදී ත් මෙබඳු සන්නිවේදන රටාවන් කෙරෙහි වලංගුභාවයක් ලැබී තිබිණි. මිනිස් ජීවිත කාලය තුළ සිදු කෙරෙන්නා වූ අතිශය වැදගත් සිද්ධීන් හා බැඳී පවතින්නට තරම් මේවා පුරාණ වැව්ගංකොටුවල තහවුරු වී තිබූ බව පෙනේ. විටෙක ඒවා කැඩිය නොහැකි, බිඳිය නොහැකි ගිවිසුම් ගනයෙහි ලා ද ගිනිය හැකි තරමට ප්‍රබල බව පෙනේ.

"වරිග කුඩුවේ චාරිත්තර අතර මුදුන් ම චාරිත්තරේ තමයි හාන්රෙද්ද එළීම. ඇවැස්ස නෑන මස්සිනාකම් පලදරන්නෙ නැන්දම්මා විසින් ලේලි ඩිංගිත්තට වැදූගෙයිදී ම හාන්රෙද්ද එළාපු දොහේ ඉඳලා ය. දීගදලග දෙන කලගම ලැබුවාම හාන්රෙද්ද එළාපු නැන්දගෙ පුතණ්ඩියා එක්ක පැල්පිල් ගැහීම ඒ වාරෙ හැටියට සිදුකළ යුතු ය. හාන්රෙද්ද එළන දොහේ ඒ කෙළි පිංචි හාන්රෙද්දේ ගගුරංබෑවොත් නැන්දාටත්, වැදූ මෝටත් ඇතිවන්නේ ඉහවහා ගිය තන්තෝසය කි. ඊට හේතුව සහලේ ඥාතීත්වය මත්තට කිරිගහට ඇන්නා වාගෙ පැහුම්බැහුම් වෙන පෙරනිමිත්ත ඒ ගගුරංබෑම වන හෙයිනි" (මානෑව 2001:143-129).

මෙහි එන "හාන්රෙද්ද" යනු නැන්දා කෙනෙකු තම ඇවැස්ස නෑනාට උපන් බිළිඳිය තැබීමට වැදූගෙයිදී ම එළන සුදුරෙදි රියන යි. ගගුරංබානවා යනු මුත්‍රාකිරීම යි. සිඟිත්තිය හාන්රෙද්දේ ගගුරංබෑවොත් අනාගත හිරගනුදෙනු සපල කෙරෙන බව ඔවුහු දන සිටිය හ. දරු උපතකදී හාන් රෙද්ද එළීම මුළු ජීවිත කාලයට ම බලපාන්නා වූ සංකේතාත්මක ක්‍රියාවක් බව එයින් පෙනේ.

"තවත් එකක්... අපි හිතමු ගෙදරක ඉස්සරහ පැත්තෙ කාමරේක, එහෙමත් නැත්නම් ගෙට පිටින් හදාපු ඇතු පැලක පිටපැත්තෙන් පිදුරු වෙණියක් වාගේ එකක් ඇදලා තියෙනව කියල. (පිදුරු වෙණියක් යනු පිදුරුවලින් ඇඹරූ ලණුවක් හෝ වැලක් වැනි යමක්) එතකොට ගමේ උදවිය දන්නවා ඒ ගෙදර ගෑනු දූරිවියක් වැඩිවිය පත්වෙලා කියල. ලොකු වුණා, මල්වර වුණා, කොටහළු වුණා, පිල හොඳවුණා ... මේ හැම දේකින්ම කියන්නෙ එකම දේ" (නානායක්කාර 1999:48).

යම් තැනකට මඟුල් යෝජනාවක් ඉදිරිපත්කිරීමේ දී 'අටංගෙඩිය' රැගෙනයාම ද තවත් අවාචික සංකේතාත්මක සන්නිවේදනය කි. 'අටංගෙඩිය' යනු පොල්පැණි මුහුකොට රසවත් ව හැදූ ඉඹුල් කිරිබත්වලින් පුරවාගත් තල්කොළ පෙට්ටියක් හෝ කුරුණිය කි.

"මෙම අටංගෙඩිය මනාලියගේ නිවසට ගෙනගිය පසු ගෙහිමියන් විසින් එය පිළිගෙන ආගන්තුක පිරිසට ඉඳුම්හිටුම්, කෑම්බීම් සපයා දෙනු ලැබේ. ආගන්තුකයින් ආපසු එද්දී මෙම අටංගෙඩිය ආපසු බාරදෙයි. ගෙනගිය කිරිබත් සහිතව ම එය ආපසු දෙනු ලැබුවහොත් එයින් අර්ථවත් වන්නේ එම මංගල යෝජනාව නො පිළිගත් බව යි. ගෙනගිය ඇඹුල් කිරිබත් නැතිව හිස් පෙට්ටිය පමණක් දෙනු ලැබුවහොත් මංගල යෝජනාව පිළිගත් බව එයින් අර්ථවත් වේ" (ඒකනායක 2000:95).

පෙරගමන් යාම, බත්බුලත් දී පිළිගැනීම, ඉඳුම්හිටුම් දීම, ආගිය තොරතුරු කතිකාව හා පසුගමන් යාම ආදී ''පස් නම්බුව'' සහිත ආගන්තුක සත්කාරයෙන් සතුටට පත්වෙන දෙපාර්ශවයේ ම ඇත්තෝ මංගල යෝජනාවේ ප්‍රතිචාරයන් පිළිබඳ කිසිවක් කතා නො කරති. එය කැමැත්ත පළ කෙරෙන්නක් නම් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරනු විනා, එසේ නො වන්නක් නම් ඒ කටයුතු කිසිදු ගැහැටකින් හෝ අමනාපයකින් තොර ව එතැනින් ම නිමාවෙයි.

විවාහය හා බැඳුණු ලිංගික කාරණාවන් සම්බන්ධයෙන් මෙහි අනන්‍ය ව පැවැති ගරු කටයුතු විනය හා සංයමය ද සුවිශේෂ වෙයි. එක් වචනයකුදු නොදොඩා සිතැඟි සපුරා පළකළ හැකිවීම කෙතරම් ආශ්චර්යවත් දැ යි හැඟේ. ගැමි සිරිතට විරිතට හා හැදියාවට අනුව සමහර ලිංගික කාරණාවන් සැමියා හා බිරිඳ අතර වුව ත් කතා කළ නොහැකි අවස්ථා එමට තිබූ බව පෙනේ. කාලීන සමාජ සංස්කෘතික පරිසරය තුළ එබඳු දේ බහුල ව තිබූ බවට ජනශ්‍රැතිය හෙළිදරව් කරයි. මේ කවිය කියවා බලන්න.

''සඳත් මෝරලා කුරහන් යාය    දිලේ
ගතත් සීතලෙන් හිරිගඩු පිපී    පෙලේ
සිතක් මතුවෙලා නුඹ වෙත ආව    කලේ
අදත් රෙද්ද වැනුව ද කෝඩුවා    වැලේ ... '' (මානෑව 2001:16).

සිදුව ඇත්තේ කුමක් ද?

''හේනේ පැල් රකිමින් සිටි වාහේ පැලේ මායියා ළඟට හදිසියේ පැමිණෙන්නේ කිසියම් සිතක් පහළ වූ හෙයිනි. නමුත්, ඇගේ දියරෙද්ද කෝඩුවා වැලේ වනා තිබීම ඔහුට ඉවසා සිටිය හැකි ද? මේ සී පදයෙන් කියැවෙන 'කෝඩුවා වැල' යනු පැලෙහි ඉදිරි වහලේ කෙරවල් කෝටුවේ සිට මිදුලේ ගසකට බැඳ ඇති රෙදිවැල කි. සැමියාගේ හෙවත් වාහේගේ දිය ඇඳුම් පමණකි මේ වැලේ වනන්නේ. නමුත්, යම් හෙයකින් බිරිඳගේ නැතහොත් මායියාගේ දියරෙද්දක් එහි වනා තිබේ නම්, එයින් අදහස් කෙරෙන්නේ ඇයට කිළි කාලය හෙවත් ඔසප් කාලය ලබා ඇති බව යි. මායියා විසින් ඒ බව සැමියාට නොකියා දන්වන සංකේතයකි මේ'' (මානෑව 2001:16-17).

වැව්බැඳි රටේ ගැහැනියක ගැබ්ගැනීම ප්‍රකාශ කෙරෙන විධි කිහිපය කි. හුදු වාචික ප්‍රකාශයන්ගෙන් තොර සංකේතාත්මක චාරිත්‍රයක් ද ඒ අතර සුවිශේෂ වෙයි. මේ උපුටාගැනීම ඒ සඳහා කදිම දෘෂ්ටාන්තය කි.

"ඔබහැත්තා වගේ ම මාත් හපනෙක් වුණා ඕං හූරේ"

"හැබෑට... ?"

"ඔව්. අද වයිතාලෙන් ම මගෙ මායියා තෙල්කිරක මගෙ පිටිපතුලෙ
මත ගෑවෙ නැතැයි ඕං ... "

"ඔහෙප්පලයං.... හෙනං ඔබහැත් අප්පුච්චෙක් වුණා ඈ?"

ඒ තවත් චාරිත්‍රයක සුලමුල ය. බිරිඳ දරුගැබක් පිහිටි බව ස්ථිරව දැනගත් පසුව ඇය තම සැමියාට ඒ බව දන්වන්නේ ඔහුගේ පිටිපතුලේ තෙල් මිශ්‍ර පොල්කිරි ටිකක් තැවරීමෙනි.

"හෙනං පිංචි නගත් තෙල් කිරක ගෑවා ඈ ? යැයි යමෙක් කියත් නම් ඉන් වටහා ගත යුත්තේ පිංචි අම්මා නැමැත්තිය ද ගැබිනියක් වූ බව ය" (මානෑව 2001: 151).

මෙබඳු සංඥාවන්හි අරුත් එවක වැව් ගංකුඩුවේ ඇත්තන්ට අමුතුවෙන් කියා දිය යුතු ඒවා නොවේ. ගොවි ගම්මානවල අපේ ඇත්තෝ බොහෝ විට සිය ජීවිත ගතකළේ සාමූහික හැඟීමෙනි. හෙනේ, කුඹුරේ, කමතේ, වැවේ, මහවනයේ හෝ ගම්මැද්දේ ද බොහෝ කටයුතු කාරණා සිද්ධ කළේ පොදු හැඟීම් ඇතිව ය. බිංහීයේ සිට අස්වනු කපා පාගා බැත මල්ල ගෙට ඇදගැනීම දක්වා ම එකී පොදු හැඟීම පිවිතුරු ගැමි සංස්කෘතිය වසා පැතිර පැවතිනි. අත්තම, කයිය, මුත්තෙට්ටුව ඊට නිදසුන් ය. දෙතුන් දොහකට පෙරදාක බුලත් දීම ඒ සඳහා කළ යුතු විධිමත් ඇරයුම් ලීලාව වුවද හූවක් කියා දහ පහළොස් දෙනෙක් ගෙන්වාගැනීම එවක ගමක එතරම් දුෂ්කර නොවූ අවාචික සන්නිවේදන ක්‍රමෝපාය කි.

හූව, අත්පොළසම, උරුවම්බෑම, ටකේ, සොකඩේ, ඝණ්ඨාරේ වැනි අවාචික ශබ්ද ද, අව්, වැසි, සුළං, හෙණගෙඩි, ගහකොළ, සතාසීපාවා හා පරිසරය ද, අඟපසඟ චලන, ඇස්, කන්, නාසා, තොල, කට, දිව ඇතුළු මුහුණේ ඉරියව් සහිත මිනිස් ක්‍රියාකාරකම් ද කියාපෑවේ තොරතුරු අදහස් රැගත් ඉඟි බිඟි ය. මේ කවරක් වුව තේරුම් ගැනීමට ගැමියාට අමුතු ඉගෙනුමක් අවැසි නොවී ය. "ගහ දන්නා මිනිහාට කොළ කඩා පෑ යුතු නැතැයි" ගැමියන් කීවේ එබැවිනි. නමුත්, කලාතුරකින් වුව එසේ නොහැකියාව ඇති අයෙක් සමාජයේ උපහාසයට ලක් වූයේ එය දෛනික සමාජ ජීවිතය කෙරෙහි ලා අත්‍යවශ්‍ය සුදුසුකමක් වන බැවිනි. "ඉඟි නොදන්නා එකාට කෙල මෝලෙන් ඇනූ" යන්න ගැමි වහර තුළ ප්‍රකට ව ඇත්තේ ද එබැවිනි.

ආරංචියකින්, පණිවිඩයකින් හෝ ප්‍රවෘත්තියකින් බොහෝවිට කියැවෙන්නේ පොදු කාරණය කි. නමුත් මෙහිදී අතිශය පෞද්ගලික තත්ත්වයන් ද හෙළිදරව් කෙරේ. ඒ කවරක් වුව ද නූතනයේ නම් ඒවා අනෙකා වෙත දැනගන්නට සලස්වනුයේ හුදු පුද්ගලාන්තර විධි ක්‍රමයකට වඩා ප්‍රවෘත්ති ප්‍රකාශයකින්, නිවේදනයකින් හෝ වෙනයම් තාක්ෂණ ක්‍රමවේදයකිනි. නූතන රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශය ත්, පුරාතන ගැමි සමාජය තුළ භාවිත ප්‍රාථමික ගැමිජන සන්නිවේදන රටාව ත් අතර වූ අරමුණු සහ අපේක්ෂා එකක් ම වුව එහි ව්‍යූහය, භාවිත ක්‍රමවේදය හා සමාජ බලපෑම වඩාත් වෙනස් බව පෙනේ. නමුත් නූතන සන්නිවේදනය තුළ ප්‍රකට අරමුණු ලෙස ගැනෙන තොරතුරු හා අධ්‍යාපනය ලබාදීම, විනෝදාස්වාදය සම්පාදනය හා කාර්යයන් සඳහා පෙළඹවීම එකී ප්‍රාථමික ගැමිජන සන්නිවේදනය තුළ ද මැනවින් කූථගැන්වෙනු පෙනේ.

එහෙත්, හුදෙක් අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය හා පුද්ගලාන්තර සන්නිවේදනයම මුල්කොටගත් පුරාතන ක්‍රමවේදයන්ට වඩා අද වඩාත් දියුණු තාක්ෂණික හා සංවිධානමය ව්‍යූහයක් මත දියත් කෙරෙන ජන හා විශ්වසන්නිවේදන ක්‍රියාමාර්ග වඩාත් බලපෑම්සහගත යැයි කීම අතිශයෝක්තියක් නොවේ. නූතන රූපවාහිනී ප්‍රවෘත්ති නිවේදනයක, ප්‍රකාශයක හෝ වාර්තාවක කාලීන සුවිශේෂත්වය එයයි.


පරිශීලිත මූලාශ්‍රයෝ

ඉලංගසිංහ, මාමිනියාවේ (2009) වැව්ගම් පඩුර, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඒකනායක, රත්න බී (2000) වැව්බැඳි රටේ වියැකෙන විත්ති, අනුරාධපුර,
මල්ටි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස්.

කහඳගමගේ, පියසේන (1990) සංස්කෘතික කැටපතක ගැමි පිළිබිඹුවː නුවරකලාවියේ ගැලතුණු කියමන් (ලිපිය) 1990 ජනවාරි සුබස සඟරාව, කොළඹ, කිණිහිර ප්‍රකාශනයක්.

දිසානායක, ජේ.බී. (1996) සිංහල ජනවහර, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නානායක්කාර, සේන (1999) රජරටසේවා නාට්‍යකලා සමීක්ෂා, කොළඹ,එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නොක්ස්, රොබට් (1681) An Historical Relation of the Island of Ceylon කෘතියේ සිංහලානුවාදය

''එදා හෙළදිව'' (අනුවාදය ඩේවිඩ් කරුණාරත්න) කොළඹ, එම්.ඩී. ගුණසේන සහ සමාගම.

පීරිස්, රල්ෆ් (1963) සිංහල සමාජ සංවිධානය, කොළඹ, සීමාසහිත සමන් ප්‍රකාශකයෝ.

මහේන්ද්‍ර, සුනන්ද (1997) සන්නිවේදන ශබ්දාකරය, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මානෑව, කේ.බී. (2001) නුවරකලාවියේ ජනවහර, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හේරත්, එච්.එම්.ඩී.ආර්. (1998) සිංහල විශ්වකෝෂය, (ප්‍රධාන කර්තෘ කේ.එන්.ඕ. ධර්මදාස) කොළඹ, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

Berlo, Davids. K (1960) The Process of Communication, New York, Holt, Rinehart and Winston.

Davids, T.W. Rhys (1871) Report on Nuwarakalaviya, Administration Report.

Oxford Advanced Learner's Dictionary (New Edition).